# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පුරාවස්තු සුරැකීමේ සංවිධානය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**පුරාවස්තු සුරැකීමේ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින්
2015 දෙසැම්බර් මස 15 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[52 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි    තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# පුරාවස්තු සුරැකීමේ සංවිධානය
# (සංස්ථාගත කිරීමේ)

## පුරාවස්තු සුරැකීමේ සංවිධානය (සංස්ථාගත කිරීම) සඳහා වූ පනතකි

පූර්විකාව.

"පුරාවස්තු සුරැකීමේ සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සභාවක්, එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, ඒ හා සම්බන්ධ සියලු පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සභාව විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක  දරන "පුරාවස්තු සුරැකීමේ සංවිධානය" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පුරාවස්තු සුරැකීමේ සංවිධානය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරාවස්තු සුරැකීමේ සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් පසු "සභාව" යනුවෙන් සඳහන් කෙරෙන) පුරාවස්තු සුරැකීමේ සංවිධානය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාද්වීපය පුරා විසිරී ඇති පුරාවිද්‍යාත්මක දේ සොයා ගැනීම සඳහා ආධාර අනුබල ලබා දීම ;

(ආ) පුරාවස්තුන් සුරැකීම සඳහා මානව හා භෞතික සම්පත් සපයා දීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ;

(ඇ) පුරාවස්තුන් සුරැකීම සඳහා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික ජනතාව ඒකරාශී කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

**4.** (1) සංස්ථාවේ සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික, ගිණුම් පරීක්ෂක සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන වෙනත් සාමාජිකයන් හය දෙනකුගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන විධායක සභාවක් විසින් සංස්ථාවේ තත්කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය. මෙම විධායක සභාව ම පාලක සභාව වන්නේ ය.

(2) ඉටු කිරීමට මෙයින් සංස්ථාව වෙත බලය පවරනු ලැබූ සියලු දේ සංස්ථාව වෙනුවෙන් ඉටු කිරීමේ බලය පාලක සභාවට ඇති අතර, එහි කර්තව්‍ය සියල්ල හෝ යම් කිසිවක් එය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීම, අත්කර ගැනීමට හෝ කුලියට ගැනීමට හෝ ඉදිකිරීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා රජයේ හෝ අනුමත බැංකු ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට හෝ ආධාර සහ පරිත්‍යාග ලෙස දේශීය හෝ විදේශීය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා වැසීමට ;

(ඇ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදලක් සුදුසු යයි සලකන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග හා සියලුම වර්ගවල ප්‍රදානයන් ඉල්ලා සිටීමට හා භාරගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු සමාගමක්, මණ්ඩලයක් හෝ පුද්ගලයකු සමග ගිවිසුම්වලට හා කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හා පරිපාලනය කිරීමට ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කරවීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා, පාරිතෝෂික ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූලව වෙනත් සියලු දේ කිරීමට,

මෙම පනතින් සංස්ථාවට බලය පවරා ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත්කර ගැනීම, නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ භාරකාර මණ්ඩලයේ බලතල, කාර්යය හා චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, සේවකයන්, අනුයෝජිතයන් පත්කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍යයන් නිශ්චය කිරීම ;

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ, සංස්ථාවේ, අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම හා පැවැත්වීම, එම රැස්වීම්වල පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යායපත්‍ර සකස් කිරීම, ගණපූරණය තීරණය කිරීම හා එහි කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) සභාවේ, සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් නිශ්චය කිරීම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම අරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති සභාවේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, එහි අරමුදල් වර්ෂය සෑම වර්ෂයක ම ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා විය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකුවක තැබීමට භාණ්ඩාගාරික විසින් කටයුතු සැලැස්විය යුතු ය.

**ගිණුම් හා විගණනය.**

8. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට භාණ්ඩාගාරික විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයකදීම රජයේ පිළිගත් විගණක නිලධරයකු විසින් සංවිධානයේ වාර්ෂික අවසාන ගිණුම් විගණනය කළ යුතු අතර, එකී විගණන වාර්තාව ඊළඟ වර්ෂයේ දී මහා සභාවට ඉදිරිපත් කළ යුතු ය.

**විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.**

9. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

10. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපතිවරයා භාරයේ තැබිය යුතු අතර, සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරිපිට දී සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නො තැබිය යුතු ය. තව ද ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

11. මෙම පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

12. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.